www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ යුද අපරාධ නවත්වනු

## Halt the war crimes in Sri Lanka

**සමාජවාදී සමානතා පක්ෂය විසිනි**
**2009 අප්‍රේල් 23**

සමාජවාදී සමානතා පක්ෂය ශ්‍රී ලංකාවේ ආන්ඩුව විසින් දිවයිනේ උතුරේ දෙමල ජනතාවට එරෙහිව දැන් කර ගෙන යනු ලබමින් පවත්නා භයංකර යුද අපරාධ හෙලා දකී. ශ්‍රී ලංකාවේ අවුරුදු 26ක් පවත්වා ගෙන යන සිවිල් යුද්ධයේ ප්‍රතිගාමී වර්ගවාදී ස්වභාවය, හමුදාව දෙමල විමුක්ති කොටි සංවිධානයේ (එල්ටීටීඊ) ඉතිරි බල ප්‍රදේශ කිහිපය අල්ලා ගන්නා ගමන් දෙමල සිවිල් ජනයාගේ ජීවිත වලට දක්වන්නාවූ අපරාධකාරී පිලිකුල තුලින් ප්‍රකාශයට පත් වේ.

තමාගේ ආන්ඩුව යෙදී සිටින්නේ "ලෝකයේ විශාලතම ප්‍රාන ඇපකරුවන් ගලවාගැනීමේ" අභ්‍යාසයේ යැයි ප්‍රකාශ කර ඇති ජනාධිපති මහින්ද රාජපක්ෂ එල්ටීටීඊ පාලිත ප්‍රදේශය අතහැර පලා එන සරනාගතයන් ධාරාව වනාහී "නිදහස සඳහා දෙන ලද යෝධ ඡන්දයක් ය"යි මැත දොඩවා ඇත. එහෙත් සත්තකින්ම නම් දහස් ගනන් ජනයා පලා එන්නේ ඊනියා යුද මුක්ත කලාපය තුල ආන්ඩුව විසින් ම නිර්මානය කර ඇති කුසගින්න, සෞඛ්‍ය පහසුකම් නැතිකම සහ ඉවක්බවක් නැතිව වස්සනු ලබන්නා වූ කාල තුවක්කු හා බෝම්බ ප්‍රහාරයෙන් පන බේරා ගැනීමට ය.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂ - නීත ආන්ඩුව මාධ්‍ය මුලුමනින්ම නිශ්ශබ්ද කිරීම මගින් තම යුද්ධ අපරාධ වසංකිරීමට උත්සාහ දරමින් සිටී. එහෙත් ඔවුන්ගේ යුද ප්‍රහාරයේ භයංකර ප්‍රතිඵල වසං කිරීම කවරෙකුටවත් කල නොහැකි ය. ඊයේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ කථක මේරි ඔකැබේ ප්‍රකාශ කලේ "මෙම හමුදා ක්‍රියාන්විතයේ දී බර ගනනක් මරා ද තුවාල කොට ද" ඇති බවය. ඉදිරියේ ඇති තත්වය ඊටත් වඩා නරක යයි ඇය අනතුරු ඇඟවූවාය. පසුගිය දින කිහිපය තුල පමනක් මිය ගිය සංඛ්‍යාව සියගනනක් ය. සටන නොනැවැත්වුව හොත් "මහා ව්‍යසනයක්" සිදුවනු ඇතැයි ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය අනතුරු හඟවා තිබේ.

සරනාගතයන් වැටී සිටින ශාරීරික තත්වය ම මීට සාක්කි ය. ආහාරයක් සෙවනක් හා සෞඛ්‍ය පහසුකමකින් තොරව මාස ගනන් කුසගින්නේ සිටි ඔවුහු ඇටසැකිලි බවට පත්ව සිටිති. මෙඩිසින් සොන් ෆ්‍රොන්තියේ (එම්එස්එෆ්) සංවිධානය වාර්තා කලේ වවුනියා රෝහල යුද මුක්ත කලාපයෙන් ගලා ආ සිය ගනන් තුවාල ලද සිවිල් ජනයාගෙන් පිරී ඉතිරී ගොසින් තිබෙන බවය. ඉන් වැඩිදෙනෙක් හමුදා ෂෙල් පතුරුවලින් ලත් තුවාලවලින් ඔත්පලව සිටිති. බෙහෙත් කිරීමට පෙර මිය ගියෝ දුසිම් ගනන්ය. මේ අය හමුදාව වට ලා ප්‍රහාර දී කරන යුද්ධයේ ගොදුරු වෙති.

මේ අවසාන ප්‍රහාරය කිසි සේත් ම විමුක්තිදායී ක්‍රියාවක් නොවේ. හමුදාව සිවිල් ජනයා තියුනු දැලිපිහි කම්බි හා සන්නද්ධ භටයන් විසින් වට කරනු ලැබූ දහ ජරා සිර කඳවුරුවලට ගාල් කරමින් සිටී. පලාඑන ජනයා සලකනු ලබන්නේ යුද සිරකරුවන් ලෙස ය. සරනාගතයන් ලෙස නොවේ. රාජපක්ෂගේ ත්‍රස්ත විරෝධී යුද්ධය වනාහී සිංහල පාලක ප්‍රභූවේ දේශපාලනය සහ වරප්‍රසාද ඇටුවන් බැස්සීම අරමුනු කර ගෙන කරනු ලබන්නකි. මෙම සට්ටනයේ දී සතුරා ලෙස ගනු ලබන්නේ සකල දෙමල සුලුතරයන් ම ය.

දිවයිනේ "විමුක්ත කරගනු ලැබූ" නැගෙනහිර පලාතේ මෙන් ම උතුරේ ද සකසමින් තිබෙන්නේ සදාකාලික යුද්ධමය පැලපදියම් වීමකි. රටේ ආර්ථික අර්බුදය එන්න එන්නම නරක අතට හැරෙන තතුතුල වුව ද යුද වියදම් නොකපන බවට ආන්ඩුව සපථ කරයි. නියෝජ්‍ය මුදල් අමාත්‍ය රංජිත් සියඹලාපිටිය පසුගිය සතියේ ජනමාධ්‍යයන්ට ප්‍රකාශ කලේ වත්මන් ආරක්ෂක හමුදා-හේවා පද්ධතිය පෙනෙන මානයක අවසාන වනු නැති බවය.

සිවිල් යුද්ධය අවුරුදු 25ක් තිස්සේ ගොඩනගා තිබෙන ආරක්ෂක තන්ත්‍රය අවසානවනු ලබන්නේ හුදෙක් දෙමල ජනයාගේ ප්‍රජාතන්ත්‍ර අයිතීන් පාගාදැමීමෙන් පමනක් නොවේ. එල්ටීටීඊයේ යුද්ධමය හැකියාව විනාශ කරන ආන්ඩුව දැන් වහාම සූදානම් වන්නේ මුලුමහත් කම්කරු පන්තියේ ජීවන තත්වයන්ට එරෙහි මහා ප්‍රහාරයකට ය. බංකොලොත්කමේ මුවවිටේ සරන ආන්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් මෙතෙක් ලබා ඇති සුවිසල්ම නය මුදල ලබා ගැනීමට සාකච්ඡා කරමින් සිටී. ආන්ඩුව කම්කරුවන් ද ගොවියන් සහ තරුනයන් ද ඇතුලු තම අයිතීන් රැකගැනීමට සටන් වදින සකල ජනයාට එරෙහිව පොලිස් රාජ්‍ය පියවරයන් යොදාගනු ඇත.

එල්ටීටීඊයට එරෙහි ආන්ඩුවේ මිල්ටරි ජයග්‍රහනයන් ගැන කොලඹ දේශපාලන සංස්ථාපිතය විසින් දැන් පවත්වාගෙන යනු ලබන යුදවාදී ඝෝෂාවේ සැබෑ අර්ථය

මෙයයි. පසුගිය අවුරුදු තුන තිස්සේ රාජපක්ෂගේ ආන්ඩුව වැඩ වර්ජනය කල කම්කරුවන්ට සහ පන්ති වර්ජනය කල ශිෂ්‍යයන්ට "කොටි ත්‍රස්තවාදීන්ගේ" හවුල්කරුවන්ය කියා ව්‍යාජ චෝදනා එල්ල කර ඇත. දැන් එල්ටීටීඊයේ පරාජයෙන් ශක්තිමත් කරනු ලැබූ ආන්ඩුව හා පාලක ප්‍රභූවේ වඩාත්ම ප්‍රතිගාමී කොටස් වැඩි කල් යන්නට පෙර තම අලුත් සතුරා - කම්කරු පන්තිය ලෙයින් මඬින ලෙස ඉල්ලා සිටිනු ඇත.

1948න් මොබ ශ්‍රී ලංකාවේ ජාතික ස්වාධීනත්වයේ සකල ඉතිහාසය වනාහී වැඩ කරන ජනතාවගේ සියලු ප්‍රජාතන්ත්‍ර හා සමාජ අවශ්‍යතාවයන් ලබා දීමට තමන්ට කිසි සේත් ම නොහැකි බව ඔප්පු කර තිබෙන පාලක පන්තියක සියලුම කොටස්වලට එල්ල වූ අධිචෝදනා පත්‍රයකි. ආරම්භයේ පටන් ම යුද්ධය පන්ති අරගලය සමග බැඳී පැවැත්තේ ය. දුබල ශ්‍රී ලංකා ධනපති පන්තිය තම අර්බුදයේ සෑම අවස්ථාවක දී ම කම්කරු පන්තිය බෙදා තම බලයට මුක්කු ගසාගැනීම සඳහා දෙමල විරෝධී ජාත්‍යොත්තමවාදය අවුලුවා ඇත. 1983 එක්සත් ජාතික පක්ෂය යුද්ධය අවුලුවාලුයේ භයංකර දෙමල විරෝධී ජන විලෝපනයන් රැල්ලක් මැද ය. මෙය ක්‍රියාත්මක කරනු ලැබුවේ ආන්ඩුවේ නිදහස් වෙලඳපොල වැඩපිලිවෙලට එරෙහිව කම්කරු පන්තියේ සටන්රැල්ලට ප්‍රතිචාර වශයෙනි.

දැන් අත ලඟට පැමින ඇති එල්ටීටීඊයේ පරාජය ප්‍රාථමික වශයෙන්ම යුදමය නොව දේශපාලන ප්‍රශ්නයකි. වෙනම ධනේශ්වර රාජ්‍යයක් පිලිබඳ එල්ටීටීඊ ඉදිරි දර්ශනය දෙමල ජනයාට මර උගුලක් බවට පත්ව තිබේ. එල්ටීටීඊයේ ප්‍රජාඝනවාදී ආකල්පය ද සිංහල සිවිල් ජනයාට එල්ල කර ඇති ප්‍රහාරයන් ද රටේ වර්ගබේදවාදය උග්‍ර කොට කොලඹ අරක් ගෙන සිටින සිංහල අන්තවාදීන්ට වාසි සපයා දී තිබේ.

වෙනම රාජ්‍යයක් සඳහා එල්ටීටීඊයේ සැලසුම් නියෝජනය කලේ දෙමල පීඩිත ජනතාවගේ ආශක්තයන් නොව දෙමල ධනපති පන්තියේ අවශ්‍යතා ය. (සිංහල ධනපති පන්තිය මෙන්ම) අවසාන විග්‍රහයේ දී එල්ටීටීඊය රැඳී පැවතුනේ ඒ හෝ මේ අධිරාජ්‍යවාදී බලවතාගේ ආධාරය මත ය. තම ඉතුරු සටන්කරුවන් වට ලනු ලැබූ තතු තුල ද සටන් විරාමයක් සඳහා ශ්‍රී ලංකා ආන්ඩුවට බලකරන ලෙස "ජාත්‍යන්තර ප්‍රජාවට" ආයාචනය කිරීමේ තැනට එල්ටීටීඊය ඇද වැටී සිටී.

එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩලය ශ්‍රී ලංකාවේ අර්බුදය ගැන සාකච්ඡා කිරීම සඳහා අද (23) රැස්වනු ඇත. දෙමල සරනාගතයන්ගේ තත්වය පිලිබඳව හස්ත විකාරයකට අමතරව වෙන කිසිම දෙයක් ඔවුන් නොකරනු ඇත. රාජපක්ෂ ආන්ඩුව හෙලාදැකීමක් හෝ වහාම සටන් නතර කරනු යැයි ඇනැවුමක් නොකරනු ඇත. ඇත්ත වශයෙන්ම, එක්සත් ජනපදයේ නායකත්වය ලත් සියලු ප්‍රධාන බලවත්තු රාජපක්ෂගේ අපරාධකාරී යුද්ධය ආරක්ෂා කොට ඔහුගේ ආන්ඩුව විසින් ප්‍රජාතන්ත්‍රවාදය දරුනුව උල්ලංඝනය කිරීමට ඇස්කන් පියා ගත්තෝ ය. ඇමරිකා එක්සත් ජනපදය දැන් මේ පිලිබඳව කනස්සල්ලක් දක්වතොත්, ඒ නම් ශ්‍රී ලංකාවේ ඇතිවන්නා වූ අස්ථාවරත්වය දකුනු ආසියාව තුල එක්සත් ජනපදයේ ආර්ථික හා මූලෝපායික අවශ්‍යතාවයන්ට ඇතිවිය හැකි බාධාවන් නිසා ම පමනි.

යුද්ධය නවතාලීමට ද දෙමල ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් රැකීමට ද සමත් එකම බලවේගය කම්කරු පන්තිය ම පමනි ශ්‍රී ලංකාවේ උතුරෙන් හා නැගෙනහිරින් සියලු හමුදා කොන්දේසි විරහිතව හා ක්ෂනිකව ඉවත් කර ගත යුතු යැයි බලකර සිටින ලෙස සමාජවාදී සමානතා පක්ෂය කම්කරුවන්ගෙන් හා තරුනයන්ගෙන් ඉල්ලා සිටී. එම ඉල්ලීම දෙමල සිංහල මුස්ලිම් යන සකල කම්කරු පන්තිය රාජපක්ෂ ආන්ඩුවට ද එහි පිලිවෙත්වලට ද එරෙහිව එකාබද්ධ කිරීමේ ලක්ෂ්‍යය වන්නේ ය. සමාජවාදී පිලිවෙත් මත පදනම් වූ කම්කරුවන්ගේ හා ගොවියන්ගේ ආන්ඩුවක් - ශ්‍රී ලංකා හා ඊලම්හි සමාජවාදී සමූහාන්ඩුවක් - මෙම ප්‍රදේශය පුරා ද ජාත්‍යන්තරව ද තම අයිතිවාසිකම් හා ජීවන තත්වයන්ට පහර වැද සිටින්නා වූ කම්කරුවන් ආකර්ෂනය කර ගැනීමේ බලගතු කේන්ද්‍රයක් බවට පත් කර ගනු ඇත.

ශ්‍රී ලංකාව තුල කරගෙන යනු ලබන භයානක ම්ලේච්ඡ ක්‍රියාවන් සෑම තැනක ම වැඩ කරන ජනයාට කෙරෙන අනතුරු ඇඟවීමකි. ධනවාදය 1930 ගනන්වලින් පසුව එහි නරකම ආර්ථික අර්බුදයට ඇද වැටෙන තතු තුල ලොව පුරා පාලක ප්‍රභූහු ඔවුන්ගේ පාලනය රැක ගැනීම සඳහා දේශපාලන ප්‍රතිගාමිත්වයේ මෙවලම් මල්ල වෙතට ලඟා වෙමින් සිටිති. ශ්‍රී ලංකාව තුල දෙමල විරෝධී ස්වෝත්තමවාදය සංක්‍රමනිකයන් විරෝධී භීතිකාව, ජාතික යුදවාදය, සහ ආගමික, වාර්ගික සහ භාෂාමය බෙදීම් මත පදනම් වූ අසංඛ්‍යෙය රූපාකරයන් තුල එහි සමාන්තරයන් සොයා ගනී. මේවා දේශීය සහ ජාත්‍යන්තර යුද්ධ සඳහා ආරම්භක ලක්ෂ්‍යය ද වන්නේ ය. එබඳු ම්ලේච්ඡත්වයක් සඳහා එකම විකල්පය වන්නේ ජාත්‍යන්තර කම්කරු පන්තිය විසින් ජාත්‍යන්තර සමාජවාදය සඳහා සටන් කිරීම ය.

© www.wsws.org